# සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යයක් අවශ්‍ය ද?

සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ මහජන එක්සත් පෙරමුණ ඇතුළු පක්ෂ තුනක් ඒකීය රාජ්‍යයක අවශ්‍යතාව වෙනුවෙන් පෙනී සිටියි. මුස්ලිම් පක්ෂ කිහිපයක් ඒකීය රාජ්‍යයකට විරුද්ධ නැත. එහෙත් සියළු දෙමළ පක්ෂ හා මුස්ලිම් පක්ෂයක් ද මාක්ස්වාදී පක්ෂ ද දේශපාලන ස්ථාවරය ලෙස ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයක අවශ්‍යතාව අත්හැර නැත. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ දෙමළ පක්ෂ හතරක් ද මුස්ලිම් පක්ෂ හතරක් ද වෙයි. එසේ ම බටහිර රටවල බලපෑම සන්ධීය රාජ්‍යයක් වෙනුවෙනි. බටහිරයන්ගේ මුදලට සේවය කරන රාජ්‍ය නොවන සංවිධාන හා එහි සාමාජිකයන් ගැන සඳහන් කිරීම අනවශ්‍ය වෙයි.

සන්ධීය රාජ්‍යයක අවශ්‍යතාව ගැන දෙමළ දේශපාලන පක්ෂ කතා කිරීමට පටන් ගත්තේ ෆෙඩරල් පක්ෂය නමින් ඉංගිරිසියෙන් ද ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය හෙවත් ඉලංකෙයි තමිල් අරසු කච්චි යනුවෙන් දෙමළ බසින් ද හඳුන්වනු ලැබූ දේශපාලන පක්ෂය පිහිටුවීමෙන් පසුව ය. එයට කලින් බණ්ඩාරනායක මහතා වැනි අය ෆෙඩරල් ක්‍රමයක් ගැන කතා කර තිබුණේ බටහිර ආභාසයෙන් හා මෙරට ඉතිහාසය ගැන පුළුල් අවබෝධයක් නොතිබීමෙන් ය. බණ්ඩාරනායක මහතා සන්ධීය ක්‍රමයක් යෝජනා කෙළේ එංගලන්තයේ සිට ආපසු පැමිණීමෙන් පසුව කෙටි කාලයක දී පමණක් බව අමතක නොකළ යුතු ය.

හතළිස් නවයේ දී පමණ චෙල්වනායගම් මහතා දෙමළ රාජ්‍ය පක්ෂ ආරම්භ කෙළේ තවදුරත් ව්‍යවස්ථාදායකයෙහි සිංහල මන්ත්‍රී සංඛ්‍යාවට සමාන දෙමළ මන්ත්‍රී සංඛ්‍යාවක් ලබාගැනීමට නොහැකි බව තේරුම් ගැනීමෙන් පසුව ය. එයට කලින් දෙමළ නායකයන් උත්සාහ කෙළේ බ්‍රිතානි ආණ්ඩුකාරයන් සමග එක් වී නොයෙකුත් උපාමාරු මගින් ව්‍යවස්ථාදායකයෙහි සිංහල මන්ත්‍රී සංඛ්‍යාවට දෙමළ මන්ත්‍රී සංඛ්‍යාව සමාන කිරීමට ය. එනම් මධ්‍යයෙහි දෙමළ නායකයන්ට, එනම් යාපන අර්ධද්වීපයෙහි වෙල්ලාල ප්‍රභූන්ට, ඇතැම් විට සිංහල නායකයන් ද ඉක්මවා යන අයුරෙන් බලය ලබා ගැනීමට ය. සර්වජන ඡන්ද බලය ලැබී සිංහල මන්ත්‍රී සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ යත්ම දෙමළ වෙල්ලාල නායකයන්ට තමන්ට එතෙක් ලැබී තිබූ වරප්‍රසාද ක්‍රමයෙන් නැතිවිය. චෙල්වනායගම් මහතා අනෙක් නායකයන්ට වඩා අඩුම තරමින් එක් කරුණකින් වෙනස් විය. ඔහු හින්දු භක්තිකයකු නොව දකුණු ඉන්දියාවේ ක්‍රිස්තියානි සභාවට (පල්ලියට) අයත් සාමාජිකයෙක් විය. මධ්‍යයෙහි සිංහලයන් හා සමාන බලයක් වෙනුවට ඔහු උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙනම රාජ්‍යයක් ඉල්ලී ය. ඒ සඳහා ඔහු ක්‍රියාමාර්ග තුනක් අනුගමනය කෙළේ ය. පළමුව ටිකක් හා පසුව හුඟක් යන පදනමින් ඔහු පළමුව ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයක් සඳහා සටන් කෙළේ ය. සන්ධීය රාජ්‍යයක් යනු වෙනම රාජ්‍යයක පළමු පියවර විය. ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය ඉංගිරිසියෙන් ෆෙඩරල් වූයේ ඒ ක්‍රියාමාර්ගය වෙනුවෙනි.

එහෙත් වෙනම රාජ්‍යයක් හෝ සන්ධීය රාජ්‍යක් යන්න යුක්තියුක්ත කළ යුතු විය. එසේ යුක්තියුක්ත කිරීම ඔහුගේ දෙවැනි ක්‍රියාමාර්ගය විය. ඒ සඳහා ඔහු ද ඔහුගේ අනුගාමිකයෝ ද විවිධ බොරු ප්‍රචාර ගෙන ගියහ. පළමුව ඔවුහු දෙමළ ජනයාට වන ඊනියා අසාධාරණ ගැන කීහ. මේ ඊනියා අසාධාරණ යනු මුල දී දෙමළ වෙල්ලාල නායකයන්ට හා යාපන අර්ධද්වීපයෙහි දෙමළ උගතුන්ට ඉංගිරිසින්ගෙන් ලැබුණු වරප්‍රසාද අහිමිවීම ය. ජනගහණයෙන් සියයට දහයකටත් අඩු වූ මේ පිරිසට රැකියාවලින් සියයට හතළිහකට වඩා හිමි විය. විශ්වවිද්‍යාලවල විශේෂයෙන් විද්‍යා පදනමක් ඇති පීඨවල ද තත්වය එසේ ම විය. මේ වරප්‍රසාද දිගින් දිගට ම තබාගැනීමේ අවශ්‍යතාවක් දෙමළ නායකයන්ට විය.

සන්ධීය රාජ්‍යයක් හා වෙන ම රාජ්‍යයක් යුක්තියුක්ත කිරීම සඳහා දෙවනුව ඔවුහු බොරු ඉතිහාසයක් ගොඩනැගීම ආරම්භ කළහ. කලක් මෙරට බොහෝ කතාබහට ලක් වූ ක්ලෙග්හෝන් සටහන හා ලන්දේසි අධිකරණ කලාප ඔවුහු ඒ සඳහා යොදාගත්හ. එමෙන් ම වයිපව මාලෙයි වැනි ඊනියා ඉතිහාස පොත් ද මේ බොරුව ගෙතීමට ඔවුහු යොදා ගත්හ. ඔවුන්ට අවශ්‍ය වූයේ උතුරු හා නැගෙනහිර පළාත්වල ඈත අතීතයේ සිට ඊනියා දෙමළ රාජ්‍යයක් තිබූ බව පෙන්වීම ය. ජාතික ව්‍යාපාරය දේශපාලනීකරණය නොවූ යුගයෙහි මේ ඊනියා ඉතිහාසය බොරු කිරීමෙහි ලා ගාමිණී ඊරියගොල්ල, සිරිල් මැතිව් ආදී මහත්වරුන් විසින් කරන ලද සේවය අද බොහෝ දෙනකුට අමතක ව තිබීම ඉතාමත්

© Prof. Nalin De Silva

කණ්ණගාටුදායක ය. උතුරු හා නැගෙනහිර පළාත් ඊනියා දෙමළ නිජභූමියක් යන බොරුව දෙමළ ජාතිවාදී නායකයන් පැතිරවූයේ ඒ සඳහා පුළුටක හෝ සාක්ෂි නොමැතිව ය.

වෙල්වනායගම් මහතාගේ තුන්වැනි ක්‍රියා මාර්ගය වූයේ සියළු දෙමළ ජනයා ද මුස්ලිම් ජනයා ද එකතු කිරීම ය. එතෙක් කල් දෙමළ නායකයන් ක්‍රියා කෙළේ යාපන අර්ධද්වීපයෙහි වෙල්ලාල ජනයා වෙනුවෙන් පමණ ය. නැගෙනහිර පළාතේ දෙමළ ජනයා තබා කිලිනොච්චියේ දෙමළ ජනයාගේ අභිවෘද්ධිය සඳහාවත් ඔවුහු ක්‍රියා නො කළහ. පසුගිය දා ආනන්ද සංගරී මහතා ඒ බව වක්‍ර ව පිළිගනිමින් කියා සිටියේ තමන්ට කිලිනොච්චිය සංවර්ධනය කිරීමට පියවර ගැනීමට හැකිවූයේ එය වෙන ම දිස්ත්‍රික්කයක් බවට පත්වීමෙන් පසුව බව ය. වෙල්වනායහම් මහතාට පැහැදිලිව පෙනුණු කරුණක් වූයේ වෙන ම රාජ්‍යයක් පිහිටුවා ගැනීමට උතුරු හා නැගෙනහිර පලාත්වල දෙමළ ජනයාගේ පමණක් නොව කඳුරට දෙමල ජනයාගේ ද මුස්ලිම් ජනයාගේ ද සහාය අවශ්‍ය බව ය. ඒ සඳහා දෙමළ නායකයෝ දෙමළ ජනයා වෙනුවට දෙමළ කතාකරන ජනයා යන සංකල්පය නිර්මාණය කළහ.

වෙල්වනායගම් මහතා සන්ධීය රාජ්‍යයක් ඉල්ලා සිටියේ වෙනම රාජ්‍යයක් සඳහා යන ගමනේ මුල් පියවර ලෙස මිස අන් කරුණක් සඳහා නො වෙයි. ඔහුට වෙනම රාජ්‍යයක් අවශ්‍ය වූයේ මධ්‍යයේ බලය ලබා ගැනීමට නොහැකි බව අනෙක් නායකයන් මෙන් නොව ඔහු තේරුම් ගත් බැවිනි. ඔහුට හා ඔහුගේ අනුගාමිකයන්ට අවශ්‍ය වූයේ වෙනම රාජ්‍යයක් පිහිටුවීමට භූමියකි. ඒ සඳහා යොදාගත හැකි ප්‍රදේශය ලෙස ඔවුන්ට වැටහී ගියේ උතුරු හා නැගෙනහිර පළාත් ය. තමන්ගේ ඒ අභිලාෂය ජනතාවගේ කර පිටින් යැවූ ඔවුහු දෙමළ ජනයාට ඊනියා අසාධාරණයක් වන බව පවසමින් ඒ විසඳීම සඳහා උතුරු හා නැගෙනහිර පළාත්වලට බලය බෙදා ෆෙඩරල් රාජ්‍යයක් ඇති කරගැනීමට කටයුතු කළහ.

එහෙත් ප්‍රශ්නය වනුයේ අසාධාරණයක් (පසුව අභිලාෂයක්) ඇත්තේ දෙමළ ජනයාට නම් විසඳුම දිය යුත්තේ දෙමළ ජනයාට මිස පළාතක හෝ දෙකක සිටින ජනයාට නො වීම ය. වෙනත් වචනවලින් කියන්නේ නම් දෙමළ ජනයාට ප්‍රශ්නයක් ඇත්නම් එයට විසඳුම උතුරු හා නැගෙනහිර පළාත්වල සිටින දෙමළ ජනයාට පමණක් සීමා නොවී මුළු රටේම සිටින සියළු දෙමළ ජනයාට පොදුවේ දියයුතු බව ය. එහෙත් දෙමළ නායකයෝ එදා හෝ අද හෝ මුළු රටේම දෙමළ ජනයාට බලපාන විසඳුමක් නො ඉල්ලති. ඔවුන් ඉල්ලන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වලට බලය බෙදන ලෙස ය. මේ අතාර්කික ය. අප කලින් ද පෙන්වා දී ඇති ආකාරයට ඉන්දියාවේ මෙන් නොව ලංකාවේ දෙමළ ජනයාගෙන් බහුතරය ඒ පළාත්වලින් පිටත ජීවත් වෙති. එබැවින් ලංකාවේ දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්නවලට විසඳුම පළාත් දෙකක ජීවත්වන දෙමළ ජනයාට පමණක් ලබාදිය යුතු යැයි කීම ගණන් ගතයුතු තරමේ දෙයක් නො වේ. එහි දිගින් දිගට ම පරස්පර පවතියි.

අද රජයේ රැකියාවල යෙදෙන දෙමළ ජනයාගේ ප්‍රතිශතය රටේම දෙමළ ජනයාගේ ප්‍රතිශතයට අඩුවිය හැකි ය. එයට හේතු දෙකක් වෙයි. එක් හේතුවක් වූයේ රැකියා ලබාදීම දේශපාලනීකරණය වීම ය. හැත්තෑගණන්වලින් පසුව මැතක් වන තුරු දෙමළ හා මුස්ලිම් පක්ෂ ආණ්ඩු පිහිටුවීමට සහභාගි නොවූහ. එහෙත් හැත්තෑවේ දශකයේ දේශපාලනිකරණයට රාජ්‍ය අංශය ලක්වීමෙන් පසු රජයේ රැකියාවලට බොහෝවිට පත්වූවෝ රජය කරවන පක්ෂවල හිතවත්තු වූහ. එබැවින් දෙමළ ජනයාට රජයේ රැකියාවලට පත්වීමට තිබූ ඉඩකඩ ඇහිරිණි. අනෙක් හේතුව ජනගහන ප්‍රතිශතයක් ලෙස ගත්කල පසුගිය දශක කිහිපයක දෙමළ ජනයා අඩුවීම ය. එබැවින් "ස්වාභාවික වරණය" යටතේ රැකියාවල හා වෙනත් තැන්වල දෙමළ අනුපාතය අද අඩු වී ඇත. අද රාජ්‍ය අංශයේ පමණක් නොව පෞද්ගලික අංශයේ ද දෙමළ ප්‍රතිශතය අඩු වී ඇත. එයට හේතුව දෙමළ ජනයාට එරෙහි වූ අසාධාරණයක් නොවන බව පැහැදිලි ය. ඒ කෙසේ වෙතත් රැකියාවල හෝ වෙනත් තැනක දෙමළ අනුපාතය ජාතික අනුපාතයට අඩු නම් ඒ නිවැරදි කළ යුතු ය. එසේ ම ඒ ඒ පළාත්වල සංවර්ධනය සම්බන්ධයෙන් යම් යම් කටයුතුවල දී තීරණ ගැනීමේ අයිතිය ඒ ඒ පළාත්වලට තිබිය යුතු ය. එහෙත් එවැනි දෑ සඳහා සන්ධීය ක්‍රමයක් ඔස්සේ බලය බෙදිය යුතු නො වේ. අවශ්‍ය වන්නේ ඒකීය රාජ්‍යයක ඇතැම් කටයුතු සඳහා තීරණ ගැනීම ඒ ඒ පළාත්වලට පැවරීමත් පරිපාලනයෙහි ඇතැම් වෙනස්කම් සිදුකිරීමත් පමණ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva